# සාප්තා සහ සාෆ්ටා ගිවිසුම්වලින් යමක් බලාපොරොත්තු වෙන්න බැහැ

**අලෙවිකරණය විවෘත ආර්ථික ක්‍රියාවලියත් සමඟ දැන් විදේශ බැලපෑමට නතුවී තිබේ. විශේෂයෙන් දකුණු ආසියානු වෙළෙඳ ගිවිසුම් මඟින් අප රටේ වෙළෙඳ පොළට සිදුවන බලපෑම අසීමිතය. මේ පිළිබඳව මෙම අදහස් දක්වන්නේ යුරෝපා ආර්ථික කොමිසම පිළිබඳ හසළ බුද්ධිමතෙකුද, ආහාර හා වෙළෙඳ අමාත්‍යාංශයේ හිටපු ලේකම් වරයෙකුද, කැලණිය විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා අංශයේ ප්‍රධාන ලෙස ද කටයුතු කළ ආචාර්ය එස්.බී. කැලේගමය.**

**ඔබ සාර්ක් දකින්නේ මොන ආකාරයටද?**

අසල්වාසී රටවල දේශපාලන, ආර්ථික හා සාමාජික යන සියළුම ක්ෂේත්‍රවල සහයෝගිතාව සඳහා ඇති සංවිධානයක් එය හොඳයි. හැමෝටම ප්‍රයෝජනවත් එකක් නිසා ක්‍රියාත්මක ලෙස ප්‍රවර්ධනය කළ යුතුයි.

**ආර්ථික සාමූහිකත්වය මේ රටවලට වැදගත්යයි ඔබ හිතනවාද?**

ඔව් ආර්ථික සාමූහිකත්වය වැදගත්, ඒත් රටකට අනිත් රටින් ඉගෙනීමට හුඟක් දේවල් තියෙනවා. ඉන්දියාව අනිත් රටවලට වඩා කෘෂිකාර්මික හා කාර්මික අතින් ඉදිරියට ගොසින්, එනිසා අන් රටවලට ඉන්දියාවෙන් හුඟක් ඉගෙනගන්නට පුළුවන්. ඉන්දියාවේ අධ්‍යාපනික හා විද්‍යාත්මක තාක්ෂණය අතීත සම්ප්‍රදායන් හා නවීන තාක්ෂණය යන දෙකින්ම සමන්විතයි. ඒනිසා අනිත් රටවලට ශ්‍රම සම්පත මේ ආයතනවලින් පුහුණු කර ගන්න පහසුයි.

**සාප්තා ගිවිසුම් පිළිබඳ ඔබේ අදහස් මොනවාද?**

ආසියාවේ, අප්‍රිකාවේ හා ලතින් ඇමරිකාවේ රටවල් සමූහයක් අතර වෙළඳාම විශාල ලෙස ක්‍රියාත්මක වෙනවා. ආසියාවේ සාප්තා සහ ආසියාන් තියෙනවා. සංවර්ධනය වන රටවල මෙසේ කණ්ඩායම් සෑදීම හැමවිට යුරෝපීය හවුල ආදර්ශයට ගෙන සිදුවන්නක්.

**යුරෝපයේ වගේ එක සමානව නිෂ්පාදන මූලාන් දියුණු රටවල් අතර, වෙළඳාම ක්‍රියාත්මක කිරීමට හැකියි. එහෙම වුනත් සංවර්ධිත රටවල් හා සංවර්ධනය වන රටවල් අතර වෙළෙඳාම් සාර්ථික වී නැහැ. උදාහරණයක් ලෙස පසුගිය කාලයේ ආසියාවේ, අප්‍රිකාවේ හා ලතින් ඇමරිකාවේ එබඳු වෙළඳාම්වලින් ලැබී ඇත්තේ බොහොම අල්ප සාර්ථක බවක්, ඊට හේතුව ඒවායේ නිෂ්පාදන ව්‍යුහයන් බොහෝ දුරට අසමාන නිසා.**

වෙළඳ ගිවිසුම්වලින් මිල අඩුවිය හැකිය. එසේ වුවත් ඉන් ප්‍රතිඵල හා ප්‍රයෝජන ලැබීමට නම් නිෂ්පාදනය කර අපනයනය කරන රටවල් තරඟකාරී මිලට හා හොඳ ප්‍රමිතියකින් යුතුව තෝරා ගැනීමට හැකියාවක් ඇති පරිදි විශාල වශයෙන් නිෂ්පාදනය කළ යුතුයි. ඒ වගේම අඛණ්ඩව ඒවා සැපයීමට එම රටවලට පුළුවන්කම තිබිය යුතුය.

සංවර්ධනය වන රටවල් බොහොමයක් මෙම තත්ත්වයේ නැහැ. වෙළඳ මනාපය බොහෝවිට කඩදාසියට සීමා වී ක්‍රියාවට නොනැඟී පවතිනවා. සංවර්ධනය වන රටවල් වල සහයෝගිතා කණ්ඩායම් අතර වෙළඳ මනාපය සාර්ථක වී වර්ධනයේ ඇත්තේ බොහොම කලාතුරකින් පමණයි. සාප්තා සහ ශ්‍රී ලංකාව අරගෙන බලන්න. ලංකාව භාණ්ඩ කීයක් නම් නියමිත ප්‍රමිතියෙන් හා අවශ්‍ය පමණට හා තරඟකාරී මිලෙන්ද යුතුව ඉන්දියානු වෙළඳපළට සපයනවාද?

**ලංකාවේ අපනයනවලට ඉන් ප්‍රයෝජනයක් නැහැ?**

ඉන්දියාවට කෙරෙන ශ්‍රී ලංකා අපනයනයන් ගණනින් හා වටිනාකමින් ඉතා අඩුයි. මෙසේ යවන කුළුබඩු, රබර් භාණ්ඩ, හා නිෂ්පාදිත භාණ්ඩ සුළු ප්‍රමාණය ලංකාවේ වෙළෙඳාම පිළිබඳ වෙනසක් ඇතිකර නැහැ. මෙම වෙළෙඳ වාසිය තුළ ඉන්දියාව තුළ තම වෙළෙඳාම ව්‍යාප්තකළ එකම

**ඉන්දියාවට කෙරෙන ශ්‍රී ලංකා අපනයනයන් ගණනින් හා වටිනාකමින් ඉතා අඩුයි. මෙසේ යවන කුළුබඩු, රබර් භාණ්ඩ, හා නිෂ්පාදිත භාණ්ඩ සුළු ප්‍රමාණය ලංකාවේ වෙළෙඳාම පිළිබඳ වෙනසක් ඇතිකර නැහැ. මෙම වෙළෙඳ වාසිය තුළ ඉන්දියාව තුළ තම වෙළෙඳාම ව්‍යාප්තකළ එකම ශ්‍රී ලාංකික නිෂ්පාදනයක් හෝ ඔබට නම්කළ හැකිද? මට නම් එකක් ගැනවත් හිතන්නට අමාරුයි. දෙවනුව සැපයීමේ බාධක අපට තිබෙනවා. නිදසුනක් ලෙස ඉන්දියාව කුළුබඩු සඳහා තම ඉල්ලුම වැඩිකළොත් කෙටි කාලයක් තුළ අපට එය සැපයීම කළ නොහැකියි. මෙම නිෂ්පාදන සඳහා ඉන්දියානු ඉල්ලුම සීමා සහිතයි. ඒ වගේම අඩුවැඩිවන ස්වරූපයේ නැහැ. වෙළඳ මනාපය නිසා ඇතිවන අඩු මිල හේතුවෙන් ඉන්දියාව වැඩි වැඩියෙන් අපෙන් මිලදී ගනීයැයි සිතන්නට බැහැ. ඉන්දියාවෙහි ඇති ඉල්ලුම අනුක්‍රමයෙන් වැඩිවෙතැයි සිතිය හැකි කර්මාන්ත ශ්‍රී ලංකාවේ තවදුරටත් ආරම්භ කළ යුතුයි.**

ශ්‍රී ලංකික නිෂ්පාදනයක් හෝ ඔබට නම්කළ හැකිද? මට නම් එකක් ගැනවත් හිතන්නට අමාරුයි.

දෙවනුව සැපයීමේ බාධක අපට තිබෙනවා. නිදසුනක් ලෙස ඉන්දියාව කුළුබඩු සඳහා තම ඉල්ලුම වැඩිකලොත් කෙටි කාලයක් තුළ අපට එය සැපයීම කළ නොහැකියි. මෙම නිෂ්පාදන සඳහා ඉන්දියානු ඉල්ලුම සීමා සහිතයි. ඒ වගේම අඩුවැඩිවන ස්වරූපයේ නැහැ. වෙළඳ මනාපය නිසා ඇතිවන අඩු මිල හේතුවෙන් ඉන්දියාව වැඩි වැඩියෙන් අපෙන් මිලදී ගනීයැයි සිතන්නට බැහැ. ඉන්දියාවෙහි ඇති ඉල්ලුම අනුක්‍රමයෙන් වැඩිවෙතැයි සිතිය හැකි කර්මාන්ත ශ්‍රී ලංකාවේ තවදුරටත් ආරම්භ කළ යුතුයි.

### සප්ටා ගිවිසුම්වල අනාගතය කෙබඳුද?

මාලේදී පැවැත්වුනු සාර්ක් සමුළුවේදී ගත් තීරණය වුනේ වසර 2001 දී සප්තා ක්‍රමය දකුණු ආසියානු නිදහස් වෙළඳ කලාපයකට පරිවර්තනය කිරීමයි. මෙම තීරණයේ පදනම වුනේ නිදහස් වෙළඳාම සංවර්ධනය වැඩි කිරීම සඳහා ප්‍රයෝජනවත් බවයි. නමුත් මෙය සත්‍යය නොවෙයි.

ලෝකයේ සියළුම සංවර්ධනය වන රටවල් තම කර්මාන්තයන් දියුණුකරගෙන ඇත්තේ බදු සහන සීමා කිරීම මගින් විදේශීය නිෂ්පාදන සාධකයන් ඊට ඇතුළුවීම වලක්වා ගැනීමෙනුයි. නැගෙනහිර ආසියානු වෙනත් නව කාර්මික ආර්ථිකයන්හිද ඊට වඩා වෙනසක් නැහැ. දකුණු කොරියාව හා තායිවානය ජපන් ආකෘතිය ගුරුකොට ගෙන තම නිෂ්පාදන කර්මාන්ත දියුණුකරගත් අතර එසේ කරනු ලැබුවේ ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාවට යොදවමිනුයි. ඉන්දියාව විසින් තම කර්මාන්ත දියුණු කරගත්තේ විදේශවලින් ඊට ඇතිවන තරඟය සීමාකරමින් හා පවත්වා ගනිමිනුයි.

නිදහස් වෙළඳපළ යටතේ කර්මාන්ත දියුණුකරගත් කිසිම රටක් ගැන මට නම් හිතන්නට බැහැ. හොංකොං සහ සිංගප්පූරුව කාර්මික යටත් විජිත ලෙස බලවත් රටවලින් මෙහෙයවන ලද නිසා ඒ දෙකෙහි ඇත්තේ සුවිශේෂ තත්ත්වයක් ඒ නිසා ස්වාධීන රටකට එවැන්නක් ලබා ගන්නට බැහැ. නිදහස් වෙළඳපළ ක්‍රමය ගැලපෙන්නේ කෘෂිකාර්මික හා කාර්මික යන අංශ දෙකින්ම ඉහළ දියුණුවක් ලබා ඇති රටවලට පමණයි.

### සප්ටා ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙබඳු වේද?

දකුණු ආසියාවේ ස්වදේශීය ආහාර නිෂ්පාදනය හා කර්මාන්ත මරා දැමීමට ඇති හොඳම උපක්‍රමයයි. ඉන්දියාවට අඩු වියදමින් ඕනෑම දෙයක් (කාර්මික භාණ්ඩ හා ආහාර) නිෂ්පාදනය කර ශ්‍රී ලාංකික වෙළඳපළ ඉන් උතුරා යවන්නට පුළුවන්. දැනට බලපවත්වන බදු යටතේ වුවත් ඉන්දියාවේ නිෂ්පාදිත වියලි මිරිස්, අර්තාපල්, ළූනු, වියලි ධාන්‍ය හා සහල්වල මිල ලංකාවේ නිෂ්පාදනයන්ට වඩා අඩුයි. රෙදිපිළි, පාවහන්, ප්ලාස්ටික් භාණ්ඩ, ඇල්මිනියම් බඩු යකඩ හා වානේ නිෂ්පාදන ආදිය සම්බන්ධයෙන් වුවත් තත්ත්වය එයයි. දේශීය කර්මාන්ත කිහිපයකට පමණක් ඉන්දියානු ලාභ භාණ්ඩවල තරඟයට යටනොවී සිටිය හැක.

නිෂ්පාදන වියදම් උදාහරණයක් ලෙස ගෙන බැලුවොත් 1993 දී ඇඟළුම් කර්මාන්තයේදී ලංකාවේ ශ්‍රම පැයක් සඳහා ඇමෙ. ඩොලර් ශත 35 වැය වන අතර ඉන්දියාවේදී එය ඩොලර් ශත 27 කි. තරඟය නිසා දේශීය කර්මාන්ත මරා දමනු ලැබුවොත් දස දහස් ගණන් රැකියා විරහිතයන්

බවට පත්වනු ඇත.

වසර 2001 වන විට සප්තා ක්‍රියාත්මක කිරීමට ඒ ඒ රජයන් පොළඹවන බව සාර්ක් කාර්මික හා වාණිජ මණ්ඩලයට ප්‍රකාශ කර තිබෙනවා.

කර්මාන්තකරුවන් සාමාන්‍යයෙන් නිදහස් වෙළඳාමට අකමැති අය වීම නිසා මෙය තේරුම්ගැනීමට අපහසුයි. ඉන්දියාවෙහි මීට පළමු රජය නිදහස් කරන ලද බැමි නැවත තදකර ආරක්ෂක ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට කර්මාන්තකරුවන් දැන් රජයට කරදර කරනවා. වත්මන් රජය මෙය පිළිගෙන සියළු ආනයන බදු 8% න් වැඩිකර දහර වානේ, කඩදාසි සහ කාඩ්බෝඩ්වලට රේගු ගාස්තු වැඩිකිරීම පසුගිය වාර්ෂික අයවැයෙන් කරනු ලැබුවා. තඹ සඳහා බදු ඊටත් වැඩි කළා. කර්මාන්තකරුවන් ඉන් සතුටට පත්වුනා. ශ්‍රී ලංකාවේ කර්මාන්තකරුවන් ද ලාභ බඩුවල තරහය ගැන පැමිණිලි කරමින් ආරක්ෂණ ප්‍රතිපත්ති ඉල්ලා සිටිනවා. එනිසා කාර්මික හා වාණිජ මණ්ඩලයේ නිදහස් වෙළඳාම පිළිබඳ ඉල්ලීම තේරුම් ගැනීම පහසුයි.

**ඉන්දු ලංකා වෙළඳාම් ගැන යමක් කිවහැකිද?**

දකුණු ආසියාවේ ලොකුම වෙළඳපළක් ඉන්දියාව. ඒ වාගේම ලංකාවේ ආනයන භාණ්ඩවල ප්‍රධාන සැපයුම්කරුවන් ඉන්දියාව. 1997 දී ඉන්දියාවෙන් ලංකාවට ගෙන්වූ බඩුවල වටිනාකම රුපියල් මිලියන 33,023 ක්, ඒ වගේම ලංකාවෙන් ඉන්දියාවට යැවූ බඩුවල වටිනාකම මිලියන 2,582 යි. ඉන්දියාව ශ්‍රී ලංකා වෙළඳපලේ හුහක්ම තරහකාරියි. නමුත් ශ්‍රී ලංකාව ඉන්දියානු වෙළඳපළේ තරහකාරී නැහැ. නිදහස් වෙළඳාමක් නැතිවම ඉන්දියාව ලංකාවේ ප්‍රධානතම බඩු සපයන්නා බවට පත්වෙලා. වෙළඳාම බදු නැතිව නිදහස්කලාම විය හැකි දේ පොඩ්ඩක් හිතන්න.

ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයා එවිට මිළ අඩුවීමේ භුකරණය නොවිඳින්නේද? නමුත් ඒ නිදහස් වෙළඳාම සඳහා ඔහු ගෙවිය යුතු මිල වන දේශීය කර්මාන්ත වසාදැමීමෙන් සහ ගොවියන් වගාවෙන් ඉවත්වීමෙන් සිදුවන රැකියාවන් අහිමි වී ජීවත්වීමේ මාර්ග නැතිවන දස දහස් සංඛ්‍යාත ප්‍රමාණය ගැන සිතිය යුතුයි. දැනටමත් විදේශ ආයතනයන් නිසා තම භාණ්ඩ අලෙවි කරගත නොහැකිව සියදිවි හානිකරගත් ගොවීන් ගැන අසන්නට ලැබෙනවා. තම ගොවීන් හා කර්මාන්තකරුවන් ආරක්ෂාකර ගැනීමට පාරිභෝගිකයා විසින් ස්වදේශීය නිෂ්පාදනය සඳහා වැඩිමිලක් ගෙවීම මිස වෙන කරන්නට දෙයක් නැහැ. නමුත් එය අවශ්‍යයි.

මෙම කර්මාන්තය තවත් ව්‍යාප්ත කිරීමට ආයෝජන වැඩි කිරීම් කෙරේ. එවිට සිදුවන්නේ කලාපයෙන් පිටත නිපදවන භාණ්ඩ තොගය වැඩිවීමය. ශ්‍රී ලංකාවේ දෙවැනි ප්‍රධාන අපනයන වන තේ නිපදවන්නේ ප්‍රධාන වශයෙන් රුසියාවට හා මැද පෙරදිග තේ මිලදී ගන්නා ප්‍රධානතම රටක් වන පාකිස්ථානය තම අවශ්‍යතාවෙන් වැඩි කොටසක් කෙන්යාවෙන් හා සුළු කොටසක් ලංකාවෙන්ද මිලදී ගනී. සිවිටැනිව අපගේ ආයතනය අඩුම මිලට ලබා ගැනීමට හැකිවන පරිදි හා නිර්යාතයන්ට ඉහළම මිල ලැබෙන පරිදි වෙළඳාම් කිරීම අසල්වැසි රටවල් සමඟ වෙළඳාම් කිරීමට වඩා වැදගත්ය. වෙළඳාමේ මූලධර්මයද එයයි. සම්ප්‍රදායිකව පුරුදු වී සිටි වෙළඳ ගනුදෙනුකරුවන්ගෙන් වෙන්වී අසල්වැසි රටවල් සමඟ වෙළඳ ගනුදෙනු කිරීම වැදගත් වන්නේ එම ගාස්තුවෙන් වඩා හොඳ මිලක් හා වඩා හොඳ වෙළඳපළක් ලැබෙන්නේ නම් පමණී.

**අප නිදහස් වෙළඳාම ප්‍රතික්ෂේප කළ යුතු බව ඔබ අදහස් කරන්නේද?**

ශ්‍රී ලංකාව වැනි තම කර්මාන්ත දියුණු කරගත යුතු, හා කෘෂි නිෂ්පාදන දියුණු කරගත යුතු හා නිෂ්පාදන වර්ගයන් ඉහළ නංවාගත යුතු රටක් නිදහස් වෙළඳාම ගැන සිතීමට තරම් තවම පරිනත වී නැහැ. දකුණු කොරියාව හා තායිවාන කලාපේ තම කෘෂි සහ කාර්මික නිෂ්පාදන තවදුරටත් දියුණුකරගත් පසු පරීක්ෂාවෙන් යුක්තව වෙළඳාම ටිකෙන් ටික නිදහස් කළ යුතුයි.

අපගේ කර්මාන්ත හා ගොවිතැන්වලට කෙලින් හිටගන්ට පුළුවන් වූ පසුව හා වෙනත් රටවල් සමඟ තරඟකාරී වන්නට පුළුවන් වූ පසුව පමණක් නිදහස් වෙළඳාම ගැන සිතිය හැකිය. මෙම අවස්ථාවේ එය සිතීම ගොනාට ඉස්සරහින් කරත්තය තැබීම වැනිය.

**සප්ටා ගිවිසුම්වල අනාගතය යහපත් විය හැකිද?**

සප්ටා උපන්ගෙයි දුබලතාවලින් යුක්තයි. පළමුවෙන්ම සාමාජික රටවල ලෝක වෙළඳාමෙන් සප්තා යටතට පත්වන්නන් කෙරේ බලපෑම් ඇතිවන්නේ අඩුවෙන්. නිදසුනක් ලෙස ශ්‍රී ලංකාව සප්තාවලට වඩා ආසියන් රටවලට භාණ්ඩ යැවීම කරනවා.

දෙවනුව සප්තා වෙළඳාම අසම්මිතිකයි. සෑම සාමාජික රටක්ම ඔවුන්ගේ අවශ්‍යතාවන්ගෙන් සැළකිය යුතු ප්‍රමාණයක් ඉන්දියාවෙන් මිලදී ගන්නා අතර ඉන්දියාව එම රටවලින් මිලදී ගන්නේ ඉතා සුළු ප්‍රමාණයක්. ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් මිලදී ගන්නා ප්‍රමාණය එම රට අපෙන් මිලදී ගන්නා ප්‍රමාණය මෙන් 13 ගුණයක් වැඩියි.

තුන්වනුව ඉන්දියාවේ නිෂ්පාදන ව්‍යුහය සැකසී ඇත්තේ අසල්වාසී රටවල අවශ්‍යතාවන් සැපයිය හැකි ආකාරයටයි. නමුත් අනෙකුත් සාමාජික රටවල ව්‍යුහය සැකසී ඇත්තේ සප්තාවලින් පිටත රටවල ඉල්ලුම සපයන ආකාරයටයි.

ඇඟළුම් නිෂ්පාදනය කරන ශ්‍රී ලංකාව, බංග්ලාදේශය, නේපාලය වැනි රටවල් නිදසුනක් ලෙස ගෙන බලන්න. මේවා නිෂ්පාදනය වන්නේ ඇමරිකාවට හා යුරෝපයටයි.

මෙම කර්මාන්තය තවත් ව්‍යාප්ත කිරීමට ආයෝජන වැඩිකිරීම් කෙරේ. එවිට සිදුවන්නේ කලාපයෙන් පිටත නිපදවන භාණ්ඩ තොගය වැඩිවීමය. ශ්‍රී ලංකාවේ දෙවැනි ප්‍රධාන අපනයනය වන තේ නිපදවන්නේ ප්‍රධාන වශයෙන් රුසියාවට හා මැද පෙරදිගට. තේ මිලදී ගන්නා ප්‍රධානතම රටක්වන පාකිස්ථානය තම අවශ්‍යතාවෙන් වැඩි කොටසක් කෙන්යාවෙන් හා සුළු කොටසක් ලංකාවෙන්ද මිලදී ගනී.

සිව්වැනිව අපගේ ආයාත අඩුම මිලට ලබා ගැනීමට හැකිවන පරිදි හා නිර්යාතයන්ට ඉහලම මිල ලැබෙන පරිදි වෙළඳාම් කිරීම අසල්වැසි රටවල් සමඟ වෙළඳාම් කිරීමට වඩා වැදගත්ය. වෙළඳාමේ මූලධර්මයද එයයි.

සම්ප්‍රදායිකව පුරුදු වී සිටි වෙළඳ ගනුදෙනුකරුවන්ගෙන් වෙන්වී අසල්වැසි රටවල් සමඟ වෙළඳ ගනුදෙනු කිරීම වැදගත් වන්නේ එම ගාස්තුවෙන් වඩා හොඳ මිලක් හා වඩා හොඳ වෙළඳපළක් ලැබෙන්නේ නම් පමණි.

අවසාන වශයෙන් කිවයුතු වන්නේ ශ්‍රී ලංකාවේ පවතින්නේ දකුණු ආසියාවේ ඇති පහළම මට්ටමේ බදු බවය. ඒවා තවදුරටත් අඩු කිරීමේ අර්ථයක් නැත. සප්තා තිබුනත් නැතත් අන්තර්ජාතික මූල්‍ය අරමුදල හා ලෝක වෙළඳ සංවිධානය මගින් උපදෙස් දීමෙන් පසුව ලොව සෑම රටකම ආනයන බදු අඩුකර ඇත.

සප්තා හා සප්තාවලට අප විසින් වුවමනාවට වඩා වැදගත්කමක් දෙන බවයි පේන්නේ. ඉන් ලැබෙන ප්‍රයෝජනය හා සසඳන විට මේ බව කිව හැකිය. නව ස්වදේශීය ප්‍රතිපත්තිය යටතේ ඉන්දියාව නැමැති සප්තාහි වැදගත්ම සාමාජික රට අතින් සාමාජික රටවලට වඩා තම නිෂ්පාදනයන් ආරක්ෂා කිරීම හා ස්වදේශී කර්මාන්ත ගොඩනැගීම පිළිබඳ වැඩි උනන්දුවක් දක්වයි.